# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## 19 පාඩම


**සැකසුම හා ඉදිරිපත් කිරීම**

**ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා**

**කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.**

**අධීක්ෂණය**

**බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 19 පාඩම
# සසුන සුරැකි සංගායනා

# සසුන සුරැකි සංගායනා



# ධර් මසංගායනාවක් යනු...

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක් වී සජ්ඣායනා කිරීමයි

ශාසනාභිවෘද්ධිකාමී මහ තෙරවරුන් විසින් බුද්ධ වචනය ඒකරාශී කොට වැරදි අදහස් ඇතුළත් වී ඇත්නම් ඒවා නිවැරදි කොට ඇති වන ගැටලු ධර්ම විනයට අනුව විසඳමින්, ශාසන ශෝධනයක් ඇති කරලීම අරමුණු කොට ගෙන සිදුකරන ක්‍රියාවලියකි

# ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය මගින් පැවැත් වූ සංගායනා 06

1. බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගිය තැන මගධ රාජ්‍යයේ රජගහ නුවර පැවති සංගායනාව
2. බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ගිය තැන විශාලා මහනුවර පැවති සංගායනාව
3. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236ක් ගිය තැන පාළලුප්නුවර දී පැවති සංගායනාව
4. ක්‍රි. පූ. 1 වැනි සියවසේ මාතලේ අලුවිහාරයේ දී පැවති සංගායනාව

5, 6. මියන්මාරයේ දී (බුරුමය) පැවති සංගායනා

# සර්වාස්තිවාදී නිකාය මගින් පැවැත් වූ සංගායනා

- කණිෂ්ක රජ දවස කාශ්මීරයේ කුණ්ඩල වන විහාරයේ දී පවත්වා ඇති සංගායනාව

**මෙය භාරතයේ පැවති හතරවන සංගාවනාවයි.**

# අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථේරවාදී සංගීතිය (පුස්තකාරූඪ සංගායනාව)

මෙම සංගායනාව ගැන වදනක්..

- ථේරවාදී බුදු දහම පළමු වරට පුස්කොළ පොත්වල ලියැවුණු සංගායනාව මෙය යි. ( බුද්ධ පරිණිර්වාණයේ පටන් ශාසන මාමක භාණක තෙරවරුන් විසින් මුඛ පරම්පරාවෙන් රැකගෙන ආ ධර්මය ග්‍රන්ථාරූඪ කිරිම මෙහි දී සිදු විය.)
- එනිසා මෙම සංගායනාව පුස්ථකාරූඪ සංගීතිය ලෙස ද හැඳින්වේ.
- ප්‍රාදේශීය නායකයෙකුගේ අනුග්‍රහයෙන්, භික්ෂූන් වහන්සේලා පන්සියයකගේ සහභාගීත්වයෙන් මෙම සංගායනාව ක්‍රි.පූ 1 සියවසෙහි සිදුකර ඇත.

# අලුවිහාරේ සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු

- අභයගිරි විහාර පාර්ශවය ඉන්දියාවෙන් පැමිණි ධර්මරුචි නම් භික්ෂුවකගේ ඉගැන්වීම ගුරුකොට ගැනීම හා එම ඉගැන්වීම් ථේරවාදී බුදුදහමට පටහැනි වීම.
- බැමිණිතියා සාගතය නම් වසර දොළහක් මුළුල්ලේ දැඩි නියඟයක් මෙම කාලයේ ඇතිවිය. මෙවැනි විපත් හමුවේ ත්‍රිපිටකය කට පාඩමින් ඉදිරියට පවත්වා ගෙන යාම අනතුරු දායක වීම.
- මෙම කාලයේ දීර්ඝ කාලයක් පැවති යුද වාතාවරණය. (වළගම්බා රජු පළවා හැර දකුණු ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමණිකයන් සත් දෙනෙකු එකිනෙකා මරා ගනිමින් දාහතර වසරක් රට පාළනය කර ඇත.)
- ලක්දිව ඇතැම් භික්ෂූන් වහන්සේලා ශාසනික පිළිවෙතින් පිරිහී යාම.
- ග්‍රන්ථ ධූරය වැඩීම සඳහා ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීම වඩාත් වැදගත් වීම.
- ධර්මය ඇසීමටත්, ඉගෙනීමටත්, ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වීමටත් ඇතමුන් තුළ පැවති උනන්දුව.

# අලුවිහාර සංගායනාවේ ප්‍රතිඵල

- ත්‍රිපිටක ධර්මය වාචෝද්ගත ව පවත්වාගෙන යාමෙන් එහි කිසියම් විකෘතිතාවක් ඇති වීමට තිබූ ඉඩකඩ මේ තුළින් මග හැරීම.
- භික්ෂූන් වහන්සේ නිකායාන්තර වශයෙන් බෙදී විවිධ මතවාදයන්හී පිහිටා ධර්මය විවරණය කිරීම තුළින් ථේරවාද බුදු දහම විෂයෙහි එල්ලවීමට තිබූ අභියෝග අවම වීම.
- පසුකාලීනව ථේරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත එය ස්ථාපිත කිරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.
- ලෝකයේ වෙනත් රටවල ථේරවාද බුදු දහම අබාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.
- බුදු දහම ව්‍යාප්ත නොවූ බටහිර රටවල පසුකාලයේ ඒ පිළිබඳ දැනුම බෙදා හැරිමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.

# කණිෂ්ක ධර්ම සංගායනාව හෙවත් භාරතයේ පැවති හතරවන සංගායනාව

මෙම සංගායනාව ගැන වදනක්..

- භාරතයේ කණිෂ්ක රජතුමාගේ රාජ්‍ය කාලයේ දී එතුමාගේ අනුග්‍රහයෙන් (ව්‍ය.ව.120- 162) මෙම සංගායනාව සිදුකරන ලදී.
- මෙය භාරතයේ පැවති හතරවන ධර්ම සංගායනාව යි.
- සර්වාස්තිවාදී භික්ෂූන් 500නමක් සහභාගී වූ නිසා මෙය සර්වාස්තිවාදී සංගායනාව ලෙස ද හැඳින්වේ.
- සංගායනාවේ ප්‍රධානත්වය පාර්ශව තෙරුන්ට පැවරුණු අතර එහි සභාතිත්වය පැවරුණේ වසුමිත්‍ර තෙරුන්ට ය.

# කණිෂ්ක ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු

- සංඝ සමාජය නිකාය වශයෙන් බෙදී ඒ ඒ නිකාය විසින් විවිධාකාරයෙන් බුදු දහම විවරණය කිරීම.

- ත්‍රිපිටක පොත්පත් එක්රැස් කිරීම හා ඒවාට සර්වාස්තිවාදී ධර්මයට අනුව අටුවා සම්පාදනය කිරීමේ අවශ්‍යතාව.

# කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රතිඵල

- සූත්‍ර, විනය, අභිධර්මය යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය.
- අටුවා ග්‍රන්ථ තඹ පත් ඉරුවල ලියවා සෙල්මුවා මංජුසාවල බහා ස්තූපයක තැන්පත් කරමින් ඒවායෙහි සුරක්ෂිතතාව තහවුරු කිරීම.
- පාලියෙන් පැවති ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම.
- විසිරී පැවති ගුරුකුල එක නිකායක් යටතට ගැනීම නිසා මහායාන සම්ප්‍රදාය ආරම්භ වීම.
- මධ්‍ය අසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා ධර්මදූත පිරිස් යෙදවීම.

# පොදුවේ ගත් විට ධර්ම සංගායනා තුළින් ගතහැකි ආදර්ශ

- සමාජය තුළ ඇති වන ඕනෑම ගැටලුවක දී සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් ලබා ගැනීමට හැකිබව.
- සුරක්ෂිත කළ යුතු දෑ නිසි අවස්තාවන්හි දී සුරක්ෂිත කිරීමට පෙළඹීම තුළින් පසු කාලීන ව ඇති වන බොහෝ ගැටලු අවම කර ගත හැකි බව.

# තෙරුවන් සරණයි...!